WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

87 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2019

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I, II
தொடர்பாடலும் ஊடகக் கல்வியும் I, II
Communication and Media Studies I, II

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II

※ **පළමුවැනි** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ද ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
※ **පළමුවැනි** ප්‍රශ්නයට ලකුණු 20ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමි වේ.

1. "ගුවනින් ගමනක් යන්න ලැබුණොත්" මැයෙන් නීලා ලියූ රචනාව 'ඉදිරිය' ළමා පුවත්පතෙහි පළව ඇති බව විදුහල්පතිතුමා උදෑසන රැස්වීමේ දී සතුටින් ප්‍රකාශ කළේ ය.
   (i) ඉහත තේමාවට අනුව රචනාව ලිවීමට නීලාට උදවු වී ඇත්තේ කුමන සන්නිවේදන වර්ගය ද?
   (ii) 'රචනාව' අයත් වන ප්‍රධාන සන්නිවේදන ස්වරූපය කුමක් ද?
   (iii) පුවත්පත අයත් වන සන්නිවේදන වර්ගයට අදාළ තවත් වාරානුකූල ව ප්‍රකාශයට පත් වන මාධ්‍යයක් නම් කරන්න.
   (iv) විදුහල්පතිතුමා සම්බන්ධ වන සන්නිවේදන වර්ගය කුමක් ද?
   (v) 'තේමාව' හැඳින්වීමට පුවත්පත් වාර්තාවක දී භාවිත කරනු ලබන යෙදුම කවරේ ද?
   (vi) පුවත්පතක අන්තර්ගතය විවිධ ආකෘති අනුව ඉදිරිපත් කෙරේ. ඉහත ලිපිය අයත් වන්නේ ඉන් කුමන ආකෘතියට ද?
   (vii) ඉහත ලිපිය පළ කරන ලද්දේ ලංකා රජයට හිමි පුවත්පතක නම් ඒ ආයතනය කුමක් විය හැකි ද?
   (viii) මෙම ලිපිය ඇසුරෙන් ඉදිරියේ දී ගුවන් විදුලි වැඩසටහනක් නිර්මාණය කිරීමට නීලා අදහස් කරයි. එහි දී ඇයට භාවිතයට ගත හැකි ශබ්ද ප්‍රයෝග **දෙකක්** යෝජනා කරන්න.
   (ix) පන්තිකාමරවල ප්‍රදර්ශනය කිරීම සඳහා නීලාගේ පුවත්පත් ලිපිය ඡායා පිටපත් කොට ගුරු මණ්ඩලය වෙත බෙදා දෙන ලදී. මේ සඳහා ඔවුන්ට භාවිත කළ හැකි ප්‍රක්ෂේපනීය **නොවන** මාධ්‍ය උපකරණ **දෙකක්** නම් කරන්න.
   (x) මාධ්‍ය භාවිතයේ දී නීලා සිය පරිකල්පනය අපූරු ලෙස භාවිත කරන බව විදුහල්පතිතුමා ප්‍රකාශ කර තිබුණි. 'පරිකල්පනය' යන්න සැකෙවින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 × 10)

WWW.OLEVELAPI.COM

2. අමරා තම පාසල් මිතුරියක වන ලක්ෂ්මීට දුරකථනයෙන් කථා කොට තමාට මඟහැරුණු ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරක සහිත පාඩමක් පිළිබඳ තරුණු විමසා සිටියා ය.
   (i) ගුවන්විදුලි දුරකථන සංවාද වැඩසටහන් ආකෘතියේ විශේෂතා **දෙකක්** නම් කරන්න.
   (ii) ද්විපුද්ගල සන්නිවේදනයේ අවශ්‍යතාව පිළිබඳව කරුණු **දෙකක්** ඔස්සේ පැහැදිලි කරන්න.
   (iii) දුරකථනය ඔස්සේ සම්බන්ධ වන දෙපාර්ශ්වය විසින් පිළිපැදිය යුතු ආචාරධර්ම **තුනක්** විස්තර කරන්න.
   (iv) පාඩමට අදාළ තොරතුරු ලබා දීම සඳහා ලක්ෂ්මී විද්‍යුත් තැපැල භාවිත කළේ නම් ලබා ගත හැකි වාසි **හතරක්** පිළිබඳ විස්තර කරන්න.

3. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයන්හි ආකෘතිය හා අන්තර්ගතය විවිධාකාර ය.
   (i) රූපවාහිනී ටෙලි නාට්‍ය තුළ ස්ත්‍රිය හා පුරුෂයා නිරූපණය වන ආකාරය අධ්‍යයනය සඳහා වැදගත් වන සංකල්පය කුමක් ද?
   (ii) කොටස් මත පදනම් ව රූපවාහිනී ටෙලි නාට්‍ය වර්ග කළ හැකි ආකාර **දෙකක්** විස්තර කරන්න.
   (iii) ගුවන්විදුලිය සඳහා පිටපත් රචනා කිරීමේ දී සපුරාලිය යුතු කොන්දේසි **තුනක්** විස්තර කරන්න.

[හයවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(iv) නූතන රූපවාහිනී වෙළෙඳ ප්‍රචාරණයේ බලපෑම පිළිබඳ පහත සඳහන් කරුණු ඇසුරෙන් සාකච්ඡා කරන්න.
A - භාණ්ඩ හා සේවා පිළිබඳ දැනුවත් කිරීම
B - ව්‍යාපාරික අනුග්‍රාහකත්වය මත යැපීම
C - මහා පරිමාණ වෙළෙඳ ප්‍රචාරණය හා නව පාරිභෝගික සංස්කෘතිය
D - විචාරශීලී ග්‍රාහකත්වයේ වැදගත්කම

4. සන්නිවේදනය තොරතුරු 'ගනුදෙනුවක්' ලෙස හඳුන්වයි.
(i) නූතන තොරතුරු ගනුදෙනුවල දී භාවිත විද්‍යුත් පුවත්පත්වල පොදු ලක්ෂණ **දෙකක්** දක්වන්න.
(ii) තම ව්‍යාපාරික ස්ථානය සඳහා සංවෘත පරිපථ රූපවාහිනී කැමරා භාවිත කිරීමට හිමිකරු අදහස් කරයි. මෙමගින් ලැබෙන වාසි **දෙකක්** විස්තර කරන්න.
(iii) ජන මාධ්‍යයෙන් ඉදිරිපත් කරන තොරතුරු ළමයාගේ සමාජ ජීවිතය කෙරෙහි කරනු ලබන බලපෑම පිළිබඳ කරුණු **තුනක්** යටතේ විස්තර කරන්න.
(iv) පහත කරුණු අතුරෙන් **දෙකක්** තොරතුරු වාර්තා කිරීමේ දී වැදගත් වන ආකාරය විස්තර කරන්න.
(a) නිවැරදි බව
(b) සමතුලිත බව
(c) පැහැදිලි බව
(d) විශ්වසනීයත්වය

5. (i) මෘදු පුවත් යනු මොනවා ද?
(ii) රාජ්‍ය මාධ්‍ය ආයතනයක් වන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ කළමනාකරණය පිළිබඳ තීරණ ගැනීමට සම්බන්ධ වන පාර්ශ්ව **දෙකක්** කෙටියෙන් හඳුන්වන්න.
(iii) රාජ්‍ය මාධ්‍ය ආයතන ප්‍රධානියෙකුට සිය රාජකාරි කටයුතුවල දී තොරතුරු වැදගත් වන අවස්ථා **තුනක්** විස්තර කරන්න.
(iv) ජනමාධ්‍ය, සමාජය කෙරෙහි ධනාත්මක ව හා සෘණාත්මක ව බලපෑම් කරන ආකාරය පිළිබඳ පහත සඳහන් අවස්ථා ඇසුරින් වෙන වෙනම පැහැදිලි කරන්න.
A - පරිභෝජන රටාව
B - රස වින්දනය

6. ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන ප්‍රභා පසුගිය ජනාධිපතිවරණයේ දී තමන්ගේ කුළුදුල් ඡන්දය භාවිත කරන ලදී.
(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු සතු ලක්ෂණ **දෙකක්** නම් කරන්න.
(ii) ජනාධිපතිවරණයක දී ප්‍රචාරණය සඳහා භාවිත කිරීමට සුදුසු රූපවාහිනී වැඩසටහන් ප්‍රභේද **දෙකක්** කෙටියෙන් හඳුන්වන්න.
(iii) මැතිවරණ වේදිකාවක අපේක්ෂකයකු සිදු කරන කතාවක් ආවරණය කිරීමේ දී අංකිත නොවන් ඩිජිටල් ඡායාරූපකරණය වඩා උචිත ය. එයට හේතු **තුනක්** විස්තර කරන්න.
(iv) මැතිවරණ කණ්ඩායම් රැස්වීම්වල දී භාවිත කිරීමට සුදුසු ප්‍රක්ෂේපණීය නොවන උපකරණ **හතරක** යෝග්‍යතාව පැහැදිලි කරන්න.

7. (i) නිර්වාචික සන්නිවේදනය යනු කුමක් ද?
(ii) නිර්වාචික ලෙස තොරතුරු ලබා දීමට ලිඛිත සන්නිවේදනයේ දී භාවිත කරන විධි ක්‍රම **දෙකක්** නම් කරන්න.
(iii) ජනමාධ්‍යවල ඇතුළත් තොරතුරු විනිවිද දැකිය හැක්කේ විචාරශීලී ග්‍රාහකයකුට පමණි. එවැනි ග්‍රාහකයකු සතු ගුණාංග **තුනක්** පැහැදිලි කරන්න.
(iv) තොරතුරු නිර්මාණාත්මක ව සන්නිවේදනය කිරීමේ දී යොදා ගන්නා පහත ප්‍රකාශන විධි නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.
(1) දෘශ්‍ය ප්‍රකාශන විධි
(2) ශ්‍රව්‍ය ප්‍රකාශන විධි

* * *

WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...